**පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය**
**සංශෝධිත විෂය නිර්දේශය**
**ශාස්ත්‍රවේදී කලා උපාධි පාඨමාලාව - බාහිර, 2021**
**පුස්තකාල හා විඥාපන විද්‍යාව**

| ස්තරය | සමාසිකය | පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම | අනිවාර්ය/ වෛකල්පිත | අධ්‍යයන සම්භාර |
|---|---|---|---|---|---|
| ස්තරය 01 | I සහ II | LISC 18214 | පුස්තකාලයාධිපතිත්වය, තොරතුරු සාක්ෂරතාවය හා තොරතුරු කුසලතා | අනිවාර්ය | 4 |
| | | LISC 18224 | පුස්තකාල, ඒවායේ සේවා, එකතු සංවර්ධනය සහ කළමනාකරණය | අනිවාර්ය | 4 |
| ස්තරය 02 | III සහ IV | LISC 28214 | ග්‍රන්ථ විඥාපන පාලනය : සූචිකරණ න්‍යාය හා භාවිතය | අනිවාර්ය | 4 |
| | | **LISC 28224** | ග්‍රන්ථ විඥාපන පාලනය : වර්ගීකරණය න්‍යාය හා භාවිතය | අනිවාර්ය | 4 |
| ස්තරය 03 | V සහ VI | LISC 38214 | විමර්ශන සේවා ,තොරතුරු සේවා සහ පුස්තකාල කළමනාකරණය | අනිවාර්ය | 4 |
| | | LISC 38224 | පුස්තකාල සඳහා පරිගණක භාවිතය සහ පුස්තකාල පුහුණුව | අනිවාර්ය | 4 |

| | |
|---|---|
| පාඨමාලා කේතය | LISC 18214 |
| වර්ගය | හර |
| මාතෘකාව | පුස්තකාලයාධිපතිත්වය, තොරතුරු සාක්ෂරතාවය හා තොරතුරු කුසලතා |
| ඉගෙනුම් ඵල | • පුස්තකාලයාධිපතිත්වය හා වෘත්තීය ආචාරධර්ම පිළිබඳ න්‍යායන් හා මූලිකාංග නිර්වචනය කිරීම.<br>• පුස්තකාල මගින් සිදුවන සමාජ හා සංස්කෘතික බලපෑම හඳුනාගැනීම.<br>• ග්‍රන්ථ නාමාවලී සහ අනුක්‍රමණිකා සම්පාදනය.<br>• හඳුනාගැනීම, නිර්වචනය, විමර්ශනය සහ ගැටලු විසඳීම<br>• මවු භාෂාව ප්‍රවීණ ලෙස භාවිතය හා පැහැදිලිකිරීම පිළිබඳ වැඩ දැනුම ලබා ගැනීම<br>• ශ්‍රී ලංකාවේ පුස්තකාල ඉතිහාසයේ සුවිශේෂී සංධිස්ථාන හඳුනා ගැනීම<br>• තොරතුරු සාක්ෂරතාවය පිළිබද සංකල්ප හා මොඩියුල හඳුනා ගැනීම<br>• තොරතුරු භාවිතය<br>• කියවීම් කුසලතා හා සාක්ෂරතා කුසලතා භාවිතය<br>• අන්තර්ජාලය ඇසුරින් තොරතුරු ගවේෂණය<br>• ස්වාධීන පර්යේෂණ හා විමසීම් තුළින් නව දැනුම ලබාගැනීම සහ ඇගයීම<br>• විවිධ මූලාශ්‍ර සහ මාධ්‍යවලින් දත්ත සහ තොරතුරු එකතුකිරීම, අගය කිරීම සහ සංස්ලේෂණය<br>• සංසිද්ධි විශ්ලේෂණය, අර්ථ නිරූපණය සහ ගැටලු විසඳීම<br>• පරිගණක භාවිතය/කාර්යක්ෂමව හා ඵලදායිව තොරතුරු තාක්ෂණය, මෘදුකාංග හා දත්ත භාවිතය |
| පාඨමාලා අන්තර්ගතය | පුස්තකාල හා විඥාපන විද්‍යාව හඳුන්වාදීම: විකාශනය, ස්වභාවය, ලක්ෂණ හා දර්ශනය. පුස්තකාලයාධිපති වෘත්තිය : ඓතිහාසික සංවර්ධනය, කාර්යභාරය සහ වෘත්තීමය ආචාරධර්ම, පුස්තකාල හා විඥාපන විද්‍යාවෙහි සමාජ කාර්යභාරය : දැනුම් පාදක සමාජයක පුස්තකාලයාධිපතිගේ කාර්යභාරය. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු උද්ධරණය, ග්‍රන්ථ නාමාවලී සහ අනුක්‍රමණිකා වර්ග, නිර්වචන හා ඒවා සම්පාදනය.<br><br>තොරතුරු සාක්ෂරතාවය : සංරචක හා මොඩියුල. මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික පුස්තකාල ද්‍රව්‍යය : මුද්‍රිත තොරතුරු හා අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු සෙවුම, ලෝක ව්‍යාප්ත ජාලය(WWW) හඳුන්වා දීම, බ්‍රවුසර(Browsers) , තොරතුරු සෙවුම් යන්ත්‍ර (Search Engines) හා තොරතුරු බිහිදොරයන් (Subject Gateways).පුස්තකාල හා සම්පත් හි කාර්යක්ෂම භාවිතය : සූචි,ග්‍රන්ථ නාමාවලී, අනුක්‍රමණිකා, සාරසංග්‍රහ මගින් තොරතුරු ගවේෂණය කිරීම. කියවීම් කුසලතා හා අරමුණු : තොරතුරු සඳහා කියවීම, ක්ෂණික කියවීම, අවබෝධය හා සටහන් ගැනීම (Skimming, scanning, comprehension and note taking), පැවරුම් පිළිබද ස්වයං ඇගයුම, පර්යේෂණ හැඳින්වීම :අර්ථ දැක්වීම, පර්යේෂණ යෝජනාවලිය පිළිබඳ මූලික දැනුම, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු උද්ධරණය, උද්ධරණ ක්‍රම, Harvard සහ APA. |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |

| | |
|---|---|
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | • Kay, Teehan. (2016). Information Literacy: Strategies for the Classroom. United States : Lulu.com<br>• Leeder, Kim. and Frierson, Eric. (Ed.) (2013). Planning Our Future Libraries : Blueprints for 2025. United States : ALA Editions<br>• Michael C. Alewine., and Mark, Canada (2017). Introduction to Information Literacy for Students. New York, United States : John Wiley & Sons Inc<br>• Mishra, P.N. (2010). Principles of library and information science. Alfa publication.<br>• Rahman, Zillur MD. (2012). Use of Information Technology in Libraries. Saarbrucken : LAP Lambert Academic Publishing<br>• Rubin, R., Rubin, R. G., & Alire, C. A. (2020). Foundations of library and information science. ALA.<br>• සිල්වා, ගාමිණී (2017). ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන සේවා ව්‍යාප්තිය. මහරගමඃ කර්තෘ.<br>• රණසිංහ,පියදාස. (1993). පුස්තකාලයාධිකාරීත්වය පිළිබඳ අදහස් කීපයකa, පුස්තකාල ප්‍රවෘත්තs, 14(4), ඔක්. – දෙසැ., (පs. 7-10)<br>• වීරසිංහ,ඩබ්. කෙa.එම්.එම්.කේ. (2001). පුස්තකාල ඉතිහාසය. දළුගම: කර්තෘ.<br>• වීරසිංහ,ඩබ්. කෙa.එම්.එම්.කේ. (2002). පොත පත වත ගොත. දළුගම: කර්තෘ.<br>• වීරසූරිය, ඩබ්ලිව්. එa' (2004). ග්‍රන්ථ නාමාවලී හා ග්‍රන්ථ නාමාවලSපිළියෙල කිරීම හා සැලසුම්කරණය පිළිබඳ සරල විග්‍රහයක්. සමාජීය විද්‍යා අධ්‍යයන, iv, ජනවාරි, (පි. 115-136)<br>• වීරසූරිය, ඩබ්ලිව්. එa' (2000). පුස්තකාලයාධිපති වෘත්තිය හා වර්තමාන පුස්තකාලයාධිපතීන්ගේ කාර්ය භාරය, පුස්තකාල ප්‍රවෘත්තs,21(4), ඔකa. – දෙසැ., (පs. 10 –13) |

| | |
|---|---|
| පාඨමාලා කේතය | LISC 18224 |
| වර්ගය | හර |
| මාතෘකාව | පුස්තකාල, ඒවායේ සේවා සහ එකතු සංවර්ධනය සහ කළමනාකරණය |
| ඉගෙනුම් ඵල | • විවිධ පුස්තකාල වර්ගයන්හි කාර්යමය වෙනස්කම් හඳුනාගැනීම.<br>• බුද්ධිමය දේපළ සංකල්පය හා ග්‍රන්ථ වෙළඳපොළ හඳුනාගැනීම.<br>• ප්‍රකාශන හිමිකම හා සාධාරණ භාවිතය පිළිබඳ නීති භාවිතය.<br>• සම්පත් බෙදාගැනීම හා පුස්තකාල සහයෝගීතා කටයුතු කිරීමට ඉගෙනීම. සක්‍රීය පුරවැසියෙකු ලෙස තම සගයන් සහ අනෙක් අය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම<br>• පුස්තකාල තාක්ෂණික සේවා ක්‍රියාවලිය හඳුනාගැනීම<br>• එකතු සංවර්ධන ක්‍රමවේද භාවිතය<br>• පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන සඳහා එකතු සංවර්ධන ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම<br>• පුස්තකාල එකතුව කළමනාකරණය |
| පාඨමාලා අන්තර්ගතය | විවිධ පුස්තකාල වර්ග හා ඒවායේ සේවා: පුස්තකාල / තොරතුරු හා ප්‍රලේඛන මධ්‍යස්ථාන හා ඒවායේ සේවා : සම්පත් බෙදාගැනීම හා පුස්තකාල සහයෝගීතාවය, පුස්තකාල ගොඩනැගිලි, උපකරණ හා ඒවයේ ප්‍රමිති. ග්‍රන්ථ වෙළඳපොළ, ප්‍රකාශනය, බුද්ධිමය දේපළ හා වාරණය.ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශන කර්මාන්තය හා ග්‍රන්ථ වෙළඳපොළ සම්බන්ධ නව ප්‍රවණතා.<br>පුස්තකාල තාක්ෂණික සේවා හඳුන්වාදීම : පුස්තකාල ද්‍රව්‍යය (මුද්‍රිත හා අමුද්‍රිත) හා මූලාශ්‍ර. එකතු සංවර්ධන ප්‍රතිපත්ති : නිර්ණායක, සංරචක. පුස්තකාල ද්‍රව්‍යය හා තොරතුරු මූලාශ්‍ර තේරීමේ ක්‍රියාවලිය, ප්‍රතිග්‍රහණය, පුස්තකාල ද්‍රව්‍යය පිරිසැකසුම්කරණය, ග්‍රන්ථ සංසරණය, එකතුව නඩත්තුව, තොග සත්‍යාපනය, අපහරණය, සංරක්ෂණය හා ප්‍රතිශ්ඨාපනය. |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | • Anderson, Joanne S. (Ed). (1996). Guide for written collection Policy Statements. Chicago : ALA<br>• Carter, C. Ruth., and Kao, L . Mary (2001). Introduction to Technical Services for Library Technicians. United States : Routledge Member of the Taylor and Francis Group |

| | |
|---|---|
| | • Dewe, M. (2017). Planning Public Library Buildings: Concepts and Issues for the Librarian (1st ed.). UK: Routledge.<br>• Evans, Edward G., Intner, S. Sheila., and Weihs, Jean (2010). Introduction to Technical Services. United States : Libraries Unlimited Inc<br>• Harvey, Ross., and Mahard, R. Martha (2014). The Preservation Management Handbook : A 21st-Century Guide for Libraries, Archives, and Museums. United States : Rowman & Littlefield<br>• Ranganathan, S. (2008). Library Manual for School,Colleges and Public Libraries (Revised ed.). India: Ess Ess Publications.<br>• අලහකෝන්, උදිත පරි. (2006).සම්පත් පාදක ඉගෙනුම් කුසලතා සහ ගුරු පුස්තකාලයාධිපතිත්වය.කොළඹ: ඇස්. ගොඩගේ<br>• සිල්වා, ගාමිණී (2017). ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන සේවා ව්‍යාප්තිය. මහරගම: කර්තෘ.<br>• වීරසිංහ,ඩබ්. කේ. එම්. එම්. කේ. (2017). පොත්පත් හසර. දළුගම: කර්තෘ.<br>• වීරසිංහ,ඩබ්. කේ. එම්. එම්. කේ. (2002). පොත පත වත ගොත. දළුගම: කර්තෘ.<br>• විමලරත්න, කේ.ඩී.ජී. (1989). පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය සහ ප්‍රතිසංස්කරණය. කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය |

| | |
|---|---|
| පාඨමාලා කේතය | LISC 28214 |
| වර්ගය | හර |
| මාතෘකාව | ග්‍රන්ථ විඥාපන පාලනය : සූචිකරණ න්‍යාය හා භාවිතය |
| ඉගෙනුම් ඵල | • ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සංවිධානය කිරීමේ න්‍යායයන් හඳුනා ගැනීම<br>• පුස්තකාල සූචියේ නව ප්‍රවණතා හඳුනා ගැනීම<br>• තොරතුරු සංවිධානය කිරීම සඳහා සූචිකරණ නීති භාවිත කිරීම<br>• ඇංග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහය (AACR2) , යන්ත්‍රපාඨ්‍ය සූචිකරණය (MARC21)සහ මූලාශ්‍ර විස්තරකරණය සහ ප්‍රවේශය (RDA) භාවිතයෙන් පුස්තකාල ද්‍රව්‍ය සූචිගත කිරීම ( AACR 2 හෝ MARC21 භාවිතයෙන් විවිධ පුස්තකාල ද්‍රව්‍ය සඳහා සූචිකරණ සංලේඛ සැකසීම)<br>• විවිධ ආකාර සූචි නිර්මාණය කිරීම<br>• විෂය ශීර්ෂ නිර්මාණය කිරීම |
| පාඨමාලා අන්තර්ගතය | ග්‍රන්ථ විඥාපන පාලනය හඳුනාගැනීම, පුස්තකාල සූචිය : අරමුණු, පරාමාර්ථ සහ කාර්යභාරයන්,පුස්තකාල සූචියේ භෞතික ස්වරූප : පරිගණක සූචිය සහ මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය ද ඇතුලුව සූචිකරණ නීති සංග්‍රහ බිහි වීම සහ විකාශනය : ඇංග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහය සහ එහි සංස්කරණ, මූලාශ්‍ර විස්තරය සහ ප්‍රවේශය, යන්ත්‍ර පාඨ්‍ය සූචිකරණය සහ සාධිකාරී පාලනය, සංලේඛ ගොනු කිරීම සහ ගොනු කිරීමේ නීති, විෂය සූචිකරණය :කොංග්‍රස් පුස්තකාලීය විෂය ශීර්ෂ ලැයිස්තුව සහ සියර්ස් විෂය ශීර්ෂ ලැයිස්තුව<br><br>ඇංග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ දෙවන සංස්කරණ, මූලාශ්‍ර විස්තරය සහ ප්‍රවේශය, යන්ත්‍ර පාඨ්‍ය සූචිකරණය භාවිතයෙන් ප්‍රායෝගික සූචිකරණය : තනි පුද්ගල කතුවරයා, ආයතනික කර්තෘ සංලේඛ, ග්‍රන්ථනාම සංලේඛ, ශීර්ෂ තේරීම සහ භාවිතය, සහාග කර්තෘ, මිශ්‍ර කර්තෘ, විශේෂ නීති, ඒකීය ග්‍රන්ථනාම, යොමු , වාරසඟරා සූචිකරණය, විශ්ලේෂණය |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | • Chan, Lois Mai.(2007). cataloguing and classification.3rd ed., The Scarecrow press, Lanham.<br>• Clack, D.H.( 1990), Authority control: principles applications and instructions, American Library Association, Chicago.<br>• රණසිංහ, පී. (2007), විෂය සූචිකරණය සහ අනුක්‍රමණිකාකරණය, කර්තෘ, කැලණිය. |

| | |
|---|---|
| | • රණසිංහ, පී. (2003) සංක්ෂිප්ත ඇංග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහය 2 - 1998 ප්‍රතිශෝධනය, කර්තෘ, රාගම.<br>• වනිගසූරිය, පී, (2018), සූචිපත්‍රිකා සම්පාදනය, කර්තෘ, නිට්ටඹුව.<br>• වනිගසූරිය, පී, (2020), සූචිකරණ න්‍යාය හා භාවිතය, නයින් පබ්ලිෂින්, ගම්පහ. |

| | |
|---|---|
| පාඨමාලා කේතය | LISC 28224 |
| වර්ගය | හර |
| මාතෘකාව | ග්‍රන්ථ විඥාපන පාලනය : වර්ගීකරණය  න්‍යාය හා භාවිතය |
| ඉගෙනුම් ඵල | • ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සංවිධානය කිරීමේ න්‍යායයන් හඳුනා ගැනීම<br>• ප්‍රමිත වර්ගීකරණ ක්‍රම භාවිතයෙන් දැනුම් මූලාශ්‍ර වර්ග කිරීම<br>• පුස්තකාල වර්ගීකරණයේ නව ප්‍රවණතා හඳුනා ගැනීම<br>• ඩිවි දශම වර්ගීකරණය භාවිතයෙන් සියලු පුස්තකාල ද්‍රව්‍ය වර්ගීකරණය කිරීම<br>• විශේෂ ලේඛන සඳහා ග්‍රන්ථ අංකන භාවිතය (විවිධ වර්ගීකරණ ශිල්පීය ක්‍රම භාවිතයෙන් ග්‍රන්ථ අංක ලබා දීම) |
| පාඨමාලා අන්තර්ගතය | පුස්තකාල වර්ගීකරණය : අවශ්‍යතාව, අරමුණු, සහ කාර්යභාරයන්, ඇමතුම් අංකය, ව්‍යුහය සහ එහි ප්‍රයෝජන, පුස්තකාල වර්ගීකරණයේ විශේෂ නීතී සහ ලක්ෂණ : ග්‍රන්ථ වර්ගීකරණයේ ලක්ෂණ, විෂයයන් නිර්මාණය, පරිගුණිත හා මුඛාශ්‍රිත විශ්ලේෂණය, වර්ගීකරණ ක්‍රම : ඩිවි දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය, දෙදිත් වර්ගීකරණය සහ කොංග්‍රස් පුස්තකාලීය වර්ගීකරණය, ඩිවි දශම වර්ගීකරණයේ 22 සහ 23 සංස්කරණයන් හි මූලධර්ම සහ ව්‍යුහය, පුස්තකාල වර්ගීකරණය සහ සූචිකරණය සංකල්ප අතර වෙනස, ප්‍රායෝගික වර්ගීකරණයේ පොදු මූලධර්ම : ඩිවි දශම වර්ගීකරණය භාවිතය, අංක ගොඩනැගීමේ උපායමාර්ග සහ ශිල්ප ක්‍රම, ග්‍රන්ථ අංකනය |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20%  ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | • Baatley, S. (2005), Classification in Theory and Practice, Chandos Publishing, Oxford.<br>• Batra, P. (2004), Subject Classification and Indexing Libraries, Mahit Publication, New Delhi.<br>• Krishan K. (2000), Theory of Classification, Vikas Publication, New Delhi.<br>• Satija, M. P. (2004), Exercises in the 22nd ed. of the Dewey Decimal Classification, Ess<br>Ess Publication, New Delhi.<br>• Weerasooriya, W.A. (2019), A Handbook for Classification Policies and Collection Management in Libraries, Riga: LAMBERT Academic Publishing. |

| | |
|---|---|
| | • අලහකෝන්, යූ. (2002), ඩිවි දශම වර්ගීකරණය : ප්‍රායෝගික ප්‍රවේශයක්, කර්තෘ, ගම්පහ.<br>• පද්මසිරි, ජී. ආර්. (2006) පුස්තකාල වර්ගීකරණය : ඩිවි දශම හා විශ්ව දශම වර්ගීකරණය පිළිබඳ හැඳින්වීමක්, කර්තෘ, ඒකල.<br>• රණසිංහ, පී. (2011) ඩිවි දශම වර්ගීකරණයේ න්‍යාය හා භාවිතය, කර්තෘ, රාගම. |

| | |
|---|---|
| පාඨමාලා කේතය | LISC 38214 |
| වර්ගය | හර |
| මාතෘකාව | විමර්ශන සේවා ,තොරතුරු සේවා සහ පුස්තකාල කළමනාකරණය |
| ඉගෙනුම් ඵල | • විමර්ශන හා තොරතුරු සේවා සංකල්පය හඳුනා ගැනීම<br>• විවිධ ආකාරයේ විමර්ශන සහ තොරතුරු මූලාශ්‍ර ඇගයීම<br>• මුද්‍රිත හා විද්‍යුත් විමර්ශන සහ තොරතුරු මූලාශ්‍ර භාවිතය<br>• කළමනාකරණ මූලධර්ම හඳුනා ගැනීම<br>• ශ්‍රී ලංකාවට අදාළ පුස්තකාල නීති සහ රෙගුලාසි හඳුනා ගැනීම<br>• පුස්තකාල පරිසරය තුළ කළමනාකරණ න්‍යායන් යෙදවීම<br>• සහයෝගීතා හා සාමූහික වැඩ සංස්කෘතීන් අගය කරන කණ්ඩායම්හි සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම |
| පාඨමාලා අන්තර්ගතය | විමර්ශන සහ තොරතුරු මූලාශ්‍ර පිළිබඳ සංකල්පීය අවබෝධය, ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ අවධානය සහිතව විමර්ශන සේවා සහ මූලාශ්‍ර හඳුන්වාදීම (මුද්‍රිත හා අමුද්‍රිත),විමර්ශන හා තොරතුරු මූලාශ්‍ර ඇගයීම, විමර්ශන සේවා වර්ග, තොරතුරු සේවා සහ ජාල, විමර්ශන හා තොරතුරු සේවාවන්හි නව ප්‍රවණතා,<br><br>කළමනාකරණය පිළිබඳ හැඳින්වීම, කළමනාකරණයේ පොදු මූලධර්ම සහ පුස්තකාල පරිසරය තුළ ඒවා භාවිතා කිරීම, පුස්තකාල මූල්‍ය; මූල්‍ය කළමනාකරණය සහ පුස්තකාල අයවැය,පුස්තකාල කාර්ය මණ්ඩලය; පුස්තකාල කමිටු, පුස්තකාල නීති සහ රෙගුලාසි, සංඛ්‍යාලේඛන සහ වාර්ෂික වාර්තා, මානව සම්පත් කළමනාකරණයඃ පුස්තකාල නායකත්වය, දැනුම කළමනාකරණය, පුස්තකාල අලෙවිකරණය සහ මහජන සම්බන්ධතා පුස්තකාල කළමනාකරණය සහ ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ පවතින ගැටලු, පුස්තකාල හා තොරතුරු ව්‍යවසායකත්වය |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |

| | |
|---|---|
| නිර්දේශිත කියවීම් | • Gorman, Jack (2014), Reference sources for small and medium sized libraries, 8th ed., ALA, Chicago<br>• Harper, Meghan (2011), Reference sources and services for youth, ALA Neal-Schuman, New York<br>• Katz, William A. (2002), Introduction to Reference work Vol. 1:Basic Information Services, 8th ed., McGraw Hill, NewYork<br>• Kumar, Krishan (2001), Reference Service, 5th ed., Vikas publication, Delhi<br>• Lankes, David.R … (et al), (2003), and Implementing Digital reference services: Setting standards and making it real,Facet publication, London.<br>• Moran, Barbara B., Morner, Claudia J. & Stueart, Robrt D. (2007), Library and Information Center Management: Library and Information Science Text Series, 7th ed., Libraries Unlimited, California<br>• Munde, Gail, (ed.) (2013), Everyday HR: A Human Resources Handbook for Academic Library Staff--print/e-book Bundle, ALA Neal-Schuman, New York<br>• Robin, Stephen P., Coulter, Mary (2005), Management, Person education, New Jersey<br>• ඇලන්, ජේන් (2005), මානව සම්පත් සංවර්ධනය හා කුසලතා වර්ධනය, කර්තෘ, කොළඹ<br>• දිසානායක, කරුණාතිලක සහ දිසානායක, මාලනී (2004), ව්‍යාපාර කළමනාකරණය: සංකල්ප සහ පරිචය සතර ප්‍රකාශකයෝ, මහරගම |

| | |
|---|---|
| පාඨමාලා කේතය | LISC 38224 |
| වර්ගය | හර |
| මාතෘකාව | පුස්තකාල සඳහා පරිගණක භාවිතය සහ පුස්තකාල පුහුණුව |
| ඉගෙනුම් ඵල | • ස්වයංක්‍රියකරණය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ යෙදුම් හඳුනා ගැනීම<br>• පරිගණක පද්ධතියක සංරචක හඳුනා ගැනීම<br>• පරිගණක දෘඩාංග මගින් දත්ත නිරූපණය, ගබඩාකරණය සහ හැසිරවීම කරන්නේ කෙසේ දැයි විස්තර කිරීම.<br>• සේවා ස්ථානවල ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෙවලම් සහ අන්තර්ජාල තාක්ෂණය භාවිතා කිරීම<br>• අන්තර්ක්‍රියාකාරී වෙබ් නිර්මාණය කිරීම<br>• පුස්තකාල දත්ත සමුදායන් නිර්මාණය කිරීම<br>• ඩිජිටල් පුස්තකාල නිර්මාණය කිරීම<br>• වෘත්තීය හා ආචාරධර්ම ගවේෂණය කිරීම සහ පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පුහුණුවීම.<br>• සංවිධානාත්මක ව්‍යුහය හඳුනා ගැනීම<br>• පුස්තකාල තුළ සැබෑ වෘත්තීය තත්ත්වය අත්විඳීම<br>• සංසිද්ධීන් විශ්ලේෂණය කර අර්ථ නිරූපණය කිරීම සහ ගැටලු විසඳීම. |
| පාඨමාලා අන්තර්ගතය | පරිගණක පද්ධතියේ දළ විශ්ලේෂණය, පුස්තකාලවල පරිගණක යෙදවුම්, මෘදුකාංගඃ විවෘත මූලාශ්‍ර ඇතුළු පද්ධති සහ යෙදුම් මෘදුකාංග, පුස්තකාලවල දත්ත සමුදායන් නිර්මාණය කිරීම හා නඩත්තු කිරීමඃ කොහා, අන්තර්ජාලය සහ එහි සේවාවන් භාවිතා කිරීම, වෙබ් නිර්මාණය සහ සංවර්ධනය. ඩිජිටල්කරණයඃ අවශ්‍යතාවය සහ ප්‍රතිලාභ.<br><br>පුස්තකාල ප්‍රේරණය සහ අනුස්ථාපනය, පුස්තකාල මෙහෙවර, දැක්ම සහ පුස්තකාල අරමුණු හඳුන්වාදීම, පුස්තකාල සැලසුම් සහ ප්‍රතිපත්ති, පුස්තකාල කාර්යාල පුහුණුව, පුස්තකාල කවුන්ටර සහ පුස්තකාලයේ විවිධ දෙපාර්තමේන්තු හා අංශ හඳුන්වාදීම, පුස්තකාල උපකරණ ක්‍රියාත්මක කිරීම හා භාවිතය පිළිබඳ පුහුණුව, අනුකලිත පුස්තකාල කළමනාකරණ පද්ධති (අයි.එල්.එම්.එස්) නිරාවරණය, පරිශීලක සේවා සැපයීම සහ පුස්තකාල සන්නිවේදනය සහ මාධ්‍ය පිළිබඳ පුහුණුව, පුස්තකාල නඩත්තුව, සංරක්ෂණය හා සංරක්ෂණය, පොත් අළුත්වැඩියා කිරීම සහ බැඳීම. |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | • Brine, Alan (ed),(2012),Handbook of library training practice and development, Ashgate, London |

| | |
|---|---|
| | • Chandra, Subhash (2005), Library and information technology, Shree Publishers, New Delhi<br>• Hambling, A.C. (2004), Evaluation and control of training, McGraw-Hill Company, New Delhi.<br>• Norlin, Elaina (2021), The Six-Step Guide to Library Worker Engagement, ALA, Chicago<br>• Oldroyd, M. (ed),(2004), Developing academic library staff for future success, Facet, Watson, M. (2008) Building your portfolio: a CILIP Guide, Facet, London<br>• Ramalingan editor (2000), Library and Information Technology concept to applications, Kalipaz publication, Delhi<br>• කරුණානන්ද, අශෝක එස්.(2001), මෘදුකාංග, තරංගි ප්‍රින්ට්ස් (මුද්‍රණය), මහරගම<br>• කරුණානන්ද, අශෝක එස්. (2002), හෙට ලොවට පරිගණක, කර්තෘ, මහරගම<br>• කළුආරච්චිල කේ. ඒ. එම්. සී. (2003), දත්ත සැකසීම, කළමණාකරණ තොරතුරු පද්ධති හා තාක්ෂණය, කර්තෘ, නුගේගොඩ |